# ශ්‍රී ලංකාවේ වැවිලි වගාව ආශ්‍රිත වතු ශ්‍රමිකයින්ගේ ජීවන තත්ත්වය

ඩී.ඩී.එස්.පී.ඩී. දුනුසිංහ, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර
surangidd@gmail.com

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ කෝපි, තේ, පොල්, රබර් යන වතු වැවිලි වගාවන්වල වර්ධනය ආරම්භ වනුයේ බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන කාලය තුළ යි. මෙම වගාවන්ගේ ව්‍යාප්තියත් සමග ම එම වතුවල සේවය කිරීම සඳහා බ්‍රිතාන්‍යයින් විසින් ඉන්දියාවෙන් කුලීකරුවන් ගෙන්වනු ලැබී ය. එම කුලීකරුවන් වතුවල සේවය සඳහා ම සිය ශ්‍රමය කැපකළ අතර, වතු කම්කරු ආර්ථිකය වැසුණු ආර්ථිකයක් ලෙසින් ක්‍රියාත්මක විය. මෙම වතු කම්කරුවන් යම් ආකාරයක පීඩාවකට ලක්කරමින් මුල් කාලයේ තිබූ ආර්ථික ක්‍රමය වෙනස් කිරීමට වතු ජනසතුකරණය, ඉඩම් ප්‍රතිසංස්කරණ මෙන් ම 1977 හඳුන්වාදුන් විවෘත ආර්ථික ක්‍රමය ද හේතු විය. මෙම වෙනස්කම් සමඟින් වතුකරයේ සිටි ද්‍රවිඩ ජනතාවගේ බන්ධිතභාවය ලිහිල්වීම සිදු වූ අතර, තමන්ගේ කැමැත්ත පරිදි රැකියාවන් තෝරා ගැනීමට නිදහසක් ඔවුන්ට ලැබුණි. අද වන විට වතු කම්කරුවෝ මෙතෙක් තමන්ගේ සම්ප්‍රදායික රැකියාවන් ලෙස සලකමින් තිබූ තේ දළු නෙළීම, රබර් කිරි කැපීම අතහැර තමන්ගේ කුසලතාවන් අනුව විවිධ සේවාවන් සපයන, කාර්මික හා අනෙකුත් නූතන අංශයන්හි රැකියාවන් කෙරෙහි යොමුවෙමින් සිටිති. ඒ අනුව මෙම වතු ශ්‍රමිකයන්ගේ පැමිණීම, ඔවුන් ජීවත් වූ ආකාරය, මෙරට රජයන් විසින් ඔවුන් වෙනුවෙන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ වර්තමානයේ ඔවුන්ගේ තත්ත්වය පිළිබඳව මෙමඟින් අවධානය යොමුකර ඇත.

**මුඛ්‍ය පදඃ** වතු කම්කරුවන්, වැවිලි ආර්ථිකය, ජීවන තත්ත්වය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ 1798 දී බ්‍රිතාන්‍යයන් මෙරටට පැමිණ මුළු රටේ ම පාලනය සියතට ගැනීමත් සමඟ එතෙක් සිදුවෙමින් පැවති සමාජ ආර්ථික වෙනස්කම් ඉක්මන් වන්නට විය . ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය යටතට පත්වූයේ අවස්ථා දෙකක දී ය. එනම් 1796 දී ලන්දේසි සතුව පැවති මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගමට හිමි වී ඉන් අනතුරුව 1802 දී බ්‍රිතාන්‍ය කිරීටයේ පාලනය යටතට පත් වූ අවස්ථාව සහ 16 වන සියවසේ අගභාගයේ පටන් පෘතුගීසීන්ගෙන් සහ ලන්දේසීන්ගෙන් එල්ල වූ ආක්‍රමණ සහ උපක්‍රමවලට සාර්ථක ලෙස මුහුණදෙමින් සිය ස්වාධීනත්වය ආරක්ෂා කොටගත් උඩරට රාජ්‍යය ද 1815 දී බ්‍රිතාන්‍යයන්ට අයිතිවීම යි. එවක් පටන් 1948 දී නිදහස දිනා ගන්නා තෙක් ම ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක් ව පැවතුණි. මෙම කාලය තුළ බ්‍රිතාන්‍යයන් විසින් මෙරටට වතු වැවිලි වගාව හඳුන්වා දුනි. එහි දී ලංකාවේ වැවිලි ආර්ථිකය වර්ධනය වන්නේ 1830 ගණන්වල සිට ය. මුල් කාලීනව කෝපි වගාව ආරම්භ කළ අතර, කෝපි වගාවේ පරිහානියත් සමඟ ම සිංකෝනා, තේ, රබර් සහ පොල් වගාවන්ට වැවිලිකරුවෝ පෙළඹුණෝ ය. 1830-1880 කාලය තුළ බ්‍රිතාන්‍යයයෝ කෝපි වගා කිරීම සඳහා සිය මූලික අවධානය යොමු කළ අතර, එම කාලය "කෝපි යුගය" ලෙස සැලකේ. කෝපි වගාවට වැළඳුනු රෝගයක්

නිසා වගාව වැනසී ගිය අතර, විකල්ප වගාවන් කෙරෙහි අවධානය යොමු කළ බ්‍රිතාන්‍ය පාලකයින් තේ වගාව කෙරෙහි අවධානය යොමු කරන අතර 1880-1939 කාලයේ රබර් වගාව ආරම්භ කරන ලදී (පියරත්න, 2005).

ශ්‍රී ලංකාවේ වතු වැවිලි වගාව ආරම්භ වී එය ක්‍රමයෙන් දියුණුවීමත් සමඟ ම බ්‍රිතාන්‍යයන් මුහුණ පෑ මූලික ම ගැටළුව වූයේ එයට අවශ්‍ය ශ්‍රමය ලබා ගැනීමේ දුෂ්කරතාවයි. එකල රාජකාරී ක්‍රමය යටතේ ශ්‍රමය රදළයන් වෙතට ද සාම්ප්‍රදායික කටයුතුවලට ද ඉඩකඩම්වලට ද බැඳී තිබිණ. 1832 දී කෝල්බෲක් කොමසාරිස්වරුන් එය අහෝසි කිරීමෙන් බලාපොරොත්තු වූයේ මෙරට ව්‍යවසායකයන්ට හිතකර වූ ශ්‍රම වෙළෙඳපොළක් ඇතිකර ගැනීම ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් සඳහා ශ්‍රමය සැපයීමේ පිළිවෙත ඇරඹිණ. වැවිලි කර්මාන්තය ශ්‍රම සූක්ෂම ව්‍යාපාරයක් වූ නිසා ම වතු වගාව පැතිරී යන විට ශ්‍රමය සඳහා ඉල්ලුම ශීඝ්‍රයෙන් පුළුල් විය. එහෙත් සිංහලයෝ මේ අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීමට ඉදිරිපත් නොවූහ. වෙනත් අය යටතේ සේවය කිරීමට, විශේෂයෙන් විදේශීයයන් යටතේ කටයුතු කිරීමට ද මුදලට ශ්‍රමය සැපයීමට ද ගැමියෝ නොකැමති වූහ. ඔවුන් පුරුදු වී සිටියේ ග්‍රාමීය ජීවිතයට යි. සේවා ඉඩම් සම්බන්ධතාවයට හැඩ ගැසී සිටි ගැමියන්ට, ශ්‍රමය මුදලට විකිණීම ප්‍රශ්නයක් විය. පිටස්තර අය යටතේ "කුලියට වැඩ කිරීම" ගැමියන් විසින් සලකනු ලැබුවේ මදිකමක් වශයෙනි, තම ආත්මාභිමානයට කැළලක් වශයෙනි. විශේෂයෙන් උඩරැටියන් මෙය සැලකුවේ තම ස්වාධීනත්වයට හානියක් ලෙසිනි. එහෙයින් වැටුප් ශ්‍රමය කෙරෙහි උඩරැටියෝ උපේක්ෂා සහගත බවක් පෙන්නුම් කළහ. මේ නිසා ශ්‍රමය සපයා ගන්නා ලද්දේ දකුණු ඉන්දියානු කුලීකරුවන් ගෙන්වා ගැනීමෙනි. ශ්‍රී ලංකාවේ භූගෝලීය හා ආර්ථික තත්වය සාපේක්ෂව යහපත් වීමත්, දකුණු ඉන්දියාවේ පැවති පහළ මට්ටමේ ජීවන තත්ත්වය නිසා දෙමළ ශ්‍රමිකයෝ මෙරටට පැමිණීමට කැමැත්තක් දැක්වූහ. ඉංග්‍රීසින් විසින් දෙන ලද පොරොන්දුවලට රැවටුණු දකුණු ඉන්දීය ජාතිකයෝ විශාල වශයෙන් මෙරටට පැමිණියහ (ඊරියගම, 1997).

ඓතිහාසිකව, ශ්‍රී ලංකාවේ වතු කම්කරුවෝ තුන්වන ලෝකයේ බොහෝ රටවල දස ලක්ෂ ගණන් කම්කරුවන්ට මුහුණපෑමට සිදු වී ඇති ඉරණමට ම මුහුණ පා සිටිති. ඔවුන්, වැවිලි කර්මාන්ත හෝ පතල් කර්මාන්ත මත හෝ පදනම් වූ ආර්ථිකයන් ගොඩනැංවීම ලක්ෂණ කොටගත් යටත් විජිතවාදය යටතේ අපරදිග සිදු වූ ධනවාදී ව්‍යාප්තියේ දහනවවන සියවසට අයත් අවධියේ ප්‍රතිඵලයකි. ශ්‍රී ලංකාව "ලිප්ටන්ගේ තේ වත්ත" බවට පත් කිරීම සඳහා මූලික පියවරවල් ගන්නා ලද්දේ 1860 ගණන් වලදී ය. එනමුත් මංමාවත්, දුම්රිය මාර්ග හා වෙනත් ප්‍රජා සේවා ඉදිකිරීම් කටයුතුවල යෙදවීම සඳහා යටත් විජිත ආණ්ඩුව විසින් ඉන්දියානු කම්කරුවන් ගෙනෙනු ලැබූ බැවින් ඉන්දියානු කම්කරුවන් ආගමනය වීමේ ක්‍රියාවලිය ඇරඹී තිබෙනුයේ දහනවවන සියවසේ ඊට පෙර කාලයේදී ය. 1830 ගණන්වල සිට කෝපි වැවිලි දියුණු කළ අතර, 1880 ගණන්වල දී කොල රෝගයකින් එම වැවිලි විනාශ වූ විට තේ වගාව එම තැන ගත්තේ ය. 19 වන සියවස අග හා 20 වන සියවස මුල මැද රට ප්‍රදේශයේ රබර් වැවිලි ද ආරම්භ කෙරිණි. කල් යාමේ දී මෙම සියලු ම වැවිලි ඉඩම්වල සේවයේ යොදවනු ලැබූ ශ්‍රමය ලබා ගැනීමේ ඉතා ලාභ සහ පහසුම මාර්ගය වූයේ ඉන්දියානු කම්කරුවා ය. චීන ජාතික කම්කරුවන් සේවයට ගැනීමට ද මුල දී ප්‍රයත්න දරා ඇතිමුත් ඔවුන් " නුසුදුසු සහ මිල අධික" යයි සළකා ඒ ගැන වැඩිදුර ක්‍රියාකිරීම අත්හැර දමන ලදී. මුල

දී සුළු වශයෙන් ඇරඹි ඉන්දියානු කම්කරුවන්ගේ ආගමනය කල්යත් ම ප්‍රමාණයෙන් විශාල විය. ඔවුන්ගේ ආගමනය හෝ විගමනය තීරණය වූයේ ශ්‍රී ලංකාවේ වතුවල තිබුණු ඉල්ලුම සහ ඔවුන්ගේ ගම්වල පැවති තත්ත්වය ද අනුව ය. නියඟයෙන්, සාගත සහ ඉන්දියාවේ වගාවන් නිසරුවීම එරටින් කම්කරුවන් පිටවීමට දිරි ගැන්වීමක් විය. මෙම දිවයිනට ඔවුන් ආගමනය සිදු වූයේ දළ වශයෙන් පහත සඳහන් අයුරිනි.

- 1840-1870 කෝපි වගාවේ ආරම්භය - ආගමනය වැඩිවීම.
- 1871-1881 කෝපි කර්මාන්තයේ උත්පාතය - වර්ෂයකට 24,000 බැගින් මෙරටට සංක්‍රමණය වීම.
- 1881-1890 කෝපි කර්මාන්තයේ පරිහානිය - මෙරටට සංක්‍රමණය අඩුවීම.
- 1891-1900 තේ වැවිලි වල ආරම්භය, ආගමනය පුළුල්වීම- වර්ෂයකට 34,000 දෙනා බැගින් පැමිණීම.
- 1901-1911 ජන සංඛ්‍යාවේ ස්වාභාවික වර්ධනයට ආගමනය මගින් සියයට 5 ක් එකතු කිරීම.
- 1923-1928 රබර් කර්මාන්තයේ උත්පාතය - වර්ෂයකට 60,000 දෙනා බැගින් මෙරටට සංක්‍රමණය වීම.
- 1931-1940 ආර්ථික පරිහානි සමය - ශ්‍රී ලංකාවෙන් පිටව යාම.
- 1941-1945 යුද්ධ කාලය - මෙරටින් පිටව යෑම. විශේෂයෙන් ම ඉන්දීය රජයේ තහනමක් නිසා ආගමනය නතරවීම.
- 1946-1949 යුද්ධයෙන් පසු කාලය - යුද සමයේ දී සිදු වූ අඩුව මඟහරිමින් ආගමනය අධික ලෙස සිදුවීම (ආර්ථික විමසුම, 1980).

මේ ආකාරයට විවිධ ප්‍රමාණයන්ගෙන් කම්කරුවෝ ලංකාවට වරින් වර ගෙන එනු ලැබී ය. එලෙස ම ඔවුන් ඉතා පහත් කුලවලට අයත් පිරිසක් වීය. එසේ කිරීමට හේතුව වූයේ පහත් කුලයේ කම්කරුවන් පාලනයට තිබූ පහසුවත් ඔවුන්ගේ විනීතභාවයත් නිසාවෙනි. මෙම කම්කරුවන් ඉන්දියාව තුළ සංවිධානය වී තිබුණේ කුලයන්ට අනුව ය. වතුකරයට පැමිණීමෙන් අනතුරුව ද වත්තේ රැකියාවෙහි නිරතවෙමින් තම කුලයන්ට අයත් වූ කටයුතු ලංකාව තුළ දී දිගට ම පවත්වාගෙන යනු ලැබී ය. මෙලෙස ලංකාවට පැමිණි කම්කරුවෝ ඉන්දියාවේ ඥාතීන් සමඟ අඛණ්ඩව තම සබඳකම පවත්වාගෙන ගියහ. 1930 වන විටත් තමන් ලංකාවේ දී උපයනු ලැබූ මුදල් වලින් කොටසක් ඉන්දියාවේ විසූ තම ඥාතීන්ගේ අවශ්‍යතාවන් සඳහා තැපැල් කරනු ලැබී ය. ඉන්දියාවෙන් කම්කරුවන් බඳවා ගනු ලැබුයේ කංගානි ක්‍රමයට ය. කංගානිවරයා ඉහළ කුලයේ අයෙකු විය. ලංකාව තුළ ද ඔවුන්ගේ සම්ප්‍රදායන් ගෙන යන්නට කටයුතු යොදන ලදී. වත්තට කම්කරුවන් අවශ්‍ය වූ විටෙක දී කංගානිවරයා ඉන්දියාවට ගොස් එම වැසියන් ණය වී තිබුණේ නම් ඒවා බේරා දමා කම්කරුවන් ලංකාවට කැඳවාගෙන එන ලදී. 19 වන සියවස වනවිට කංගානි ක්‍රමය අනුව සේවකයින් බඳවා ගැනීමේ දී එක් කම්කරුවකු වෙනුවෙන් රු. 10 ක් කංගානිට ගෙවනු ලැබී ය. මෙම මුදල ණය තුරුස් ගෙවා දමන්නටත්, සේවයට බඳවා ගැනීමෙන් පසු වත්ත දක්වා ගමන් පහසුකම් සලසන්නටත් යොදවනු ලැබී ය. 1920 වන විටත් වත්ත තුළ ක්‍රමවත් වෘත්තීය සමිතියක් දක්නට නො ලැබිණි. කම්කරුවන්ගේ ප්‍රශ්න විසඳන්නට කංගානිවරයා ම මැදිහත් විය. කංගානි කෙනෙකු උදේ පෙරට්ටුවට එන්නට ප්‍රථම සුපර්වයිසර් කෙනෙකු හෝ කොන්දොස්තරවරයෙකු උදෑසන පෙරට්ටුව පවත්වා

තිබුණි නම් කංගානිගේ දොෂාරෝපණයට ඉහත නිලධාරීන් දෙදෙනා ඉලක්ක විය (පියරත්න, 2005).

වතු තුළට ගෙනෙනු ලැබූ කම්කරුවන් බාහිර ගම්මානයන්ගෙන් වෙන්කර තැබීමට පාලකයන් මෙන් ම කංගානිවරයා ද මහන්සි ගත්තේ ය. වෘත්තීය සමිති නායකයන්ට හෝ ඒ වෙනුවෙන් කටයුතු කරන්නට වත්ත තුළට පැමිණෙන්නට අවසර නො ලැබුණි. බ්‍රිතාන්‍යය පාලනය යටතේ වතුකරය තුළ වැසුණු ආර්ථිකයක් ඇතිවිය. මෙම තත්ත්වය නියම ධනවාදී ලක්ෂණයක් නොවේ. ආහාර වර්ග පවා පාලකයින් විසින් කම්කරුවන්ට ණයට දෙනු ලැබී ය. එකල ද්‍රවිඩ කම්කරුවන්ට සිංහල භාෂාව උච්චාරණයට එතරම් හැකියාවක් නො වූ අතර, වත්තෙන් පිටට ගමන් නොකළ හෙයින් ලෝක දැක්ම පුළුල් වූයේ ද නැත. මෙම වතුවල සිටි ඉන්දීය කම්කරුවන්ට පදිංචිය සඳහා ලැයිම් කාමරයක් ලැබුණි. එහි අයිතියක් වතු කම්කරුවන්ට නොවී ය. වත්තේ සේවකයන්ට නොමිලේ රජයේ රෝහලෙන් බෙහෙත් ලැබුණි. සේවකයන්ගෙන් මුදල් අය කිරීමේ පදනම මත හාල්, පිටි, සීනි වැනි ආහාර ද්‍රව්‍ය පාලකයන් විසින් වත්තට ගෙනවිත් අලෙවි කරනු ලැබීය (පියරත්න, 2005).

**වතු කම්කරුවන් වෙනුවෙන් මුල්කාලීන රජයන් ගෙන ඇති ක්‍රියාමාර්ග**

- වතු කම්කරුවන්ගේ සුභසාධන කටයුතු

ඉන්දියානු කම්කරුවන් බඳවා ගන්නා විට විවිධ වූ සහනයන් ලැබෙන පරිදි අණ පණත් පැනවිණි. 1902 සිට රජය මගින් "ටින් ටිකට්" ක්‍රමය සකසනු ලැබී ය. මේ යටතේ කම්කරුවන්ගේ ගමන් හා ආහාර වියදම් යටත්විජිත රජය විසින් දරනු ලැබී ය. 1904 දී වතු ත්‍රිචිනාපොලිහි ඇති කළ ලංකා කම්කරු කොමිසම මඟින් දකුණු ඉන්දියාවෙන් කම්කරුවන් බඳවා ගැනීම අධීක්ෂණය කරන ලදී. මෙහි දී අදාළ වියදමින් 25% ක් යටත්විජිත රජය දරන්නට භාරගන්නා ලදී. වතුවල පැරණි කම්කරුවන්ට අවශ්‍ය වූ සහල් වතු පාලකයින් විසින් සැපයිණි. මේ හැර පිටි, සීනි, පරිප්පු වැනි ආහාර ද්‍රව්‍ය ද වත්තට ගෙනැවිත් බෙදා දෙන ලදී. කම්කරුවන්ට නොමිලේ ලැයිම් කාමර සැපයිණි. පසු කාලයේ දී "ක්වෝටර්ස්" ලබා දෙන්නට කටයුතු යොදන ලදී. වත්ත තුළ අධ්‍යාපන කටයුතු 1889 දී ආරම්භ කර ඇත. දිවා කාලයේ දී දරුවන් නතර කරනු ලබන දිවා සුරැකුම් මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් මෙකල පාසැල් ඇරඹිණි (පියරත්න, 2005).

- ලංකාවේ මැතිවරණ ක්‍රමය හා ද්‍රවිඩ කම්කරුවන්ගේ ප්‍රජා අයිතිය.

බ්‍රිතාන්‍ය පාලනයේ මුල් යුගවල දී ලංකාවට ඉන්දීය කම්කරුවන් සීමා රහිතව ගෙන්වනු ලැබී ය. මෙය ලංකාවේ සමාජ ආර්ථික පසුබිමට හිතකර වූයේ නැත. මෙරට ශ්‍රමිකයන්ගේ අතිරික්තයක් ඇති වූ අතර, එයින් වැඩි වාසි ලැබූයේ බ්‍රිතාන්‍ය වැවිලි සමාගම් ය. මේ නිසා මෙරට වතු කම්කරු අතිරික්තයක් ඇති කිරීම සම සමාජ පක්ෂය ප්‍රතික්ෂේප කළෝ ය. 1939 මැයි 09 වන දින ඇන්. ඇම්. පෙරේරා රාජ්‍ය මන්ත්‍රණ සභාවට යෝජනාවක් ගෙන එනු ලැබී ය. එයින් කියවුණේ ලංකාවට ඉන්දීය කම්කරුවන් ගෙන්වීම සම්පූර්ණයෙන් නතර කළයුතු බවයි. අවුරුදු 05කට අඩු කාලයක් මෙරට වාසය කළ කම්කරුවන් නැවත ඉන්දියාවට යැවීමට සිංහල නියෝජිතයෝ යෝජනා කළහ. ලංකාවේ රැකියා වියුක්ති තත්ත්වයක් ඇතිවීම හා දෙමළ වැසියන් සිංහල ජනතාවගේ

රැකියා සොරා ගත්තවුන් ලෙස මතයක් ගොඩනැඟීම නිසා ඉන්දියානු කම්කරුවන් ලංකාවට පැමිණීම නවතා දමන බව 1939 අගෝස්තු 01 දින ඉන්දියානු ආණ්ඩුව ලංකා ආණ්ඩුවට දැනුම් දුනි.

පුරවැසි ප්‍රශ්නය හා ඡන්ද බලය පිළිබඳ අවධානය යොමු කරන විට දී පහත සඳහන් සිදුවීම් සිදු විය.

1. 1931 ඩොනමෝර් කොමිසමේ යෝජනා වලට අනුව අවුරුදු පහක් මෙරට වාසය කළ ඉන්දීය කම්කරුවන්ට ඡන්ද බලය ලැබුණි. ඒ අනුව 100,000 කට ඡන්ද බලය හිමිවිය. එලෙස ම මෙම කාලය තුළ එවකට මෙරට සිටි ද්‍රවිඩ කම්කරු නායකයින් එකතු වී ලංකා ඉන්දියානු කොංග්‍රස් සමිතිය පිහිටුවා ගැනීම. ඉන් පසුව ලංකාවට ඉන්දියානු කම්කරුවන්ගේ ආගමනය නතර වූ අතර ලංකා සම සමාජ පක්ෂයේ යෝජනාවකට අනුව 1947 මැතිවරණයේ දී මෙරට වාසය කළ සියළු ම ඉන්දියානුවන්ට ඡන්දය දීමේ අවස්ථාව උදාවිය.
2. 1959 දී බණ්ඩාරනායක මහතා විසින් වතු කම්කරු ප්‍රජාවගේ දේශපාලන නිදහස තහවුරු කිරීම සඳහා ඉන්දියානු ඡන්ද දායකයින්ගේ නම් සාමාන්‍ය ඡන්ද ලේඛනයට ඇතුල් කරන්නට ක්‍රියාමාර්ග ගැනීම. පුරවැසි පනත තුළින් පුරවැසිභාවය ලබාදුන් පිරිස 134,188 ක් විය. 1964 වනවිට 134,276 දෙනෙකුට පුරවැසිභාවය ලබා දී තිබුණි (ආර්ථික විමසුම, 1980).
3. 1964 දී අත්සන් කළ සිරිමා-ශාස්ත්‍රී ගිවිසුමට අනුව ඉන්දියානු කම්කරුවන් 525,000 කට ඉන්දියානු පුරවැසිභාවය ලබා දෙන්නට කටයුතු සූදානම් කෙරුණි. ඉන්දියානු කම්කරුවන් 300,000 කට ලංකාව තුළ පුරවැසිභාවය ලබා දෙන්නට කටයුතු යෙදුණි (බියන්විල, 2013).
4. 1977න් පසු කාලයේදී තොණ්ඩමන් මහතා ජේ. ආර්. ජයවර්ධන මහතාගේ පාලනය සමග එකතු වී 95,000ක් පමණ වන වතු කම්කරුවන්ට ප්‍රජා අයිතිය ලබා දෙන්නට සමත් විය. මේ අයුරින් ඉන්දියානු කම්කරුවන්ට ලංකාවේ පුරවැසිභාවය ලැබුණි (පියරත්න, 2005).

- ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වූ කාලය (1975-1992)

බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ ගැමි ජනතාවගෙන් ඉතා අඩු මුදලකට ඉඩම් ලබාගත් අතර, ඒවායින් උපරිම ප්‍රයෝජන ගන්නට උත්සහ දැරීම නිසා පාංශු ඛාදනය ද උග්‍ර වී පස නිසරු විය. ඇතැම් තැනක දී ඉඩම් අක්කරයක් ශත 50 කට පමණ මිලට ගැනීමෙන් ඉඩම් හිමියන්ට ද අසාධාරණයක් සිදු විය. වනාන්තර ශීඝ්‍ර ලෙස එළි කරන්නට වීම නිසා මෙරට වනාන්තර ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් අඩු විය. මේ අයුරින් නිසරු වූ භූමිය සංරක්ෂණය කරගැනීම රජය සතු වගකීමක් විය. 1972 හා 1975 ඉඩම් ප්‍රතිසංස්කරණ පනත් මගින් අක්කර 1,000,000 ක පමණ ඉඩම් රජයට පවරා ගන්නා ලදී. එය මුළු රටේ ඉඩම් ප්‍රමාණයෙන් 1/15 ක් විය. 1958 දී පිහිටවනු ලැබූ රාජ්‍ය වැවිලි සංස්ථාව මගින් අක්කර 10,000 කින් යුත් වතු 75 ක් පාලනය කරන ලදී. 1972 දී ඇති වූ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම මගින් රාජ්‍ය වැවිලි සංස්ථාවට ඉඩම් අක්කර 38,000 ක් ලබා දුනි. 1975 ඉඩම් ප්‍රතිසංස්කරණ මගින් ඉඩම් අක්කර 100,000 ක් ලබා දුනි. මේ යටතේ පාලනය විකේන්ද්‍රණය කර ප්‍රාදේශීය කාර්යාල හා ප්‍රාදේශීය කළමනාකරුවන් ඇති කරන ලදී. රාජ්‍ය වැවිලි සංස්ථාවට ඉඩම් පවරාදීම ත් සමග ම ඇති වූ කළමනාකරණය

තුළ දී වතු නිවාස සඳහා සුභසාධන භාරකාරයක් ඇති කරන ලදී. මේ යටතේ විදේශාධාර ලබාගනිමින් වතු නිවාස අලුත්වැඩියාව හා ඒවාට විදුලිය, ජල පහසුකම් හා සෞඛ්‍යය පහසුකම් ලබා දෙන්නට උත්සහ දරන ලදී. එලෙස ම තොණ්ඩමන් මහතාගේ යෝජනාවට අනුව ලංකාවේ වතු පාසල් දියුණු කරන්නට සීඩා (SIDA) ආධාර ලබා දෙන්නට කටයුතු යෙදුණි (පියරත්න, 2005).

- වතු සමාගම් යටතට පැවරීමෙන් පසු කාල පරිච්ජේදය (1992 සිට කාලය)

1977 න් පසු ලංකාවේ පාලන කටයුතු භාරගත් එක්සත් ජාතික පක්ෂ රජය පෞද්ගලික අංශය කෙරෙහි විශාල විශ්වාසයකින් කටයුතු කළේ ය. එම රජය විවෘත ආර්ථික ප්‍රතිපත්තිය හඳුන්වාදීමත් සමග විශාල කර්මාන්ත හා කාර්මික අංශ තවදුරටත් රජය සතු කර තබා ගැනීම කොහෙත් ම කළ නොහැකි කාර්යයක් විය. මේ අනුව රජය සතු කර්මාන්තශාලාවන්, රටේ නොයෙකුත් කාර්මික හා කෘෂි ක්ෂේත්‍ර පුද්ගලික අංශයට පවරා දෙන ලදී. රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත්ව තිබූ වතු ද පුද්ගලික සමාගම්වලට බදුදීම ආරම්භ කරන ලදී. මෙලෙස සමාගම්වලට පැවරීමෙන් පසුව අදාළ සමාගම් විසින් වතු විශාල වශයෙන් සූරාකන්නේ යැයි විවේචනයන් ද ඇතිවිය. බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ විවිධ සමාගම් යටතේ පාලනය වූ වතු නිදහසින් පසු රජයට පවරා ගැනීමෙන් අනතුරුව මෙලෙස නැවතත් සමාගම් යටතට පැවරීම පැරණි යුගයක් කරා ගමන් කිරීමක් වැනි විය. වතු සමාගම් පාලනයට පවරා ගැනීමෙන් අනතුරුව කම්කරුවන්ට ද වත්තේ කොටස් හිමිවිණි. එක් කම්කරුවෙකු වෙනුවෙන් ප්‍රධාන සමාගම සතු වූ කොටස්වලින් 10% ක් වෙන් කෙරුණි. ඉන් අනතුරුව එතෙක් වසරකට වරක් ගෙවූ ලාභ මුදල් වෙනුවට අදාළ කොටස්වලට හිමි ලාභාංශ කම්කරුවන්ට හිමිවිය (පියරත්න, 2005).

### වතු කම්කරුවන් වෙනුවෙන් මෑතකාලීන රජයන් ගෙන ඇති ක්‍රියාමාර්ග

වතුකරයේ වෙසෙන ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සහ සුභසාධනය පිළිබඳ රජයේ ප්‍රතිපත්තියෙහි මූලික හරය වනුයේ ඔවුනට රටෙහි අනෙක් පුරවැසියන්ට මෙන් සමාන තත්ත්වයක් ලබාදීම යි. මේ අනුව ශ්‍රී ලංකාවේ මෑතකාලීන රජයන් මඟින් වතුකරයේ ජනතාව වෙනුවෙන් විවිධ ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇති ආකාරය දැකගත හැකි ය. එනම්, මනා සෞඛ්‍යය සේවාවක් සැපයීම තුළින් ජීවන තත්ත්වය උසස් කරලීම හා රෝග නිවාරණ අවස්ථා වැඩි දියුණු කිරීම, සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් සහ පුහුණු වෛද්‍ය කාර්ය මණ්ඩල වැඩි දියුණු කිරීම තුළින් ජීවන තත්ත්වය උසස් කරලීම හා රෝග සුව කිරීමේ අවස්ථා බහුල කිරීම, දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ පෙර පාසල් ඉදි කිරීම, නව ගුරුවරුන් බඳවා ගැනීම සහ ගුරුවරුන්ට මනා පුහුණුවක් ලබාදීම තුළින් පෙර පාසල් සංවර්ධනය සහ අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම, යටිතල පහසුකම් සංවර්ධනය, ගුරුවරුන් පුහුණු කිරීම සහ දරුවන් පාසල් යැවීමට දෙමාපියන් දැනුවත් කිරීම වැනි ක්‍රියාමාර්ග හරහා සැමට මූලික අධ්‍යාපනය ලබාදීම සහ ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම, දැනට තිබෙන පාසල් වැඩිදියුණු කිරීම, ගුරුවරුන් පුහුණු කිරීම සහ අමතර විෂයමාලාවන් ඇතුළත් කිරීම වැනි ක්‍රියාමාර්ග තුළින් ද්විතියික අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ සමාන අධ්‍යාපනික පරිසරයක් ඇතිකිරීම, ක්‍රියාකාරී ඉගෙනුම් මධ්‍යස්ථාන සහ ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම හරහා අවිධිමත් අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය නැංවීම, ශුභසාධන පහසුකම්

සැපයීම සහ වතු ප්‍රජාව හා කළමනාකරණය අතර සහයෝගීතාව වර්ධනය කිරීම මඟින් වතු අංශය තුළ පවත්නා රැකියා පසුබිම හොඳ තත්ත්වයකට ගෙන ඒම, වෘත්තීය මඟපෙන්වීම් හා වෘත්තීය අධ්‍යාපනය තුළින් වතුකරයේ තරුණයිනට රැකියා ඉඩප්‍රස්ථා පුළුල් කිරීම, ව්‍යවසායකත්ව පුහුණුව හා සුළු පරිමාණ ණය යෝජනාක්‍රම දිරිගැන්වීම මඟින් කුසලතා සංවර්ධනය සම්බන්ධයෙන් අවස්ථාවන් උදාකරදීම, ඉඩම් සපයාදීම, නිවාස ණය සහ ද්‍රව්‍ය ආධාර ලබාදීම වැනි ලක්ෂණවලින් සමන්විත ස්වයං ආධාරක ප්‍රවේශයක් මත පුළුල් නිවාස සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම, පානීය ජලය සහ සනීපාරක්ෂාව සැපයීම, වතු මාර්ග කි.මී. 8,000 ක් සහ සම්බන්ධ මාර්ග කි.මී. 200 ක් පුනරුත්ථාපනය කිරීම මඟින් වතු ඇතුළත සහ වතුවලින් පිටත ප්‍රදේශ සමග පහසු ගමනාගමන පද්ධතියක් ඇති කිරීම, විදුලිබලය සැපයීම, සන්නිවේදන ක්‍රමයන් වඩා ශක්තිමත් කිරීම යනාදී ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත (දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව 2006-2016).

## වතු කම්කරුවන්ගේ වර්තමාන තත්ත්වය

වතු කම්කරුවන්ගේ වර්තමාන තත්ත්වය පිළිබඳව අවධානය යොමු කරන විට වතු ජනගහනය, ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳව ග්‍රාමීය හා නාගරික අංශයන්ට සාපේක්ෂව කොතරම්දුරට වෙනස්වීම්වලට භාජනය වී ඇත්දැයි සොයාබැලීම වැදගත් වේ. එහි දී වතු අංශයේ ජනගහනය අනෙකුත් අංශයන්ට සාපේක්ෂව පහත පරිදි දැක්විය හැකි ය.

වගුව 01: අංශ අනුව ජනගහනය (මිලියන වලින්)

| අංශය | 2006/2007 | 2009/2010 | 2012/2013 |
|---|---|---|---|
| නාගරික | 2.7 | 2.8 | 3.6 |
| ග්‍රාමීය | 14.7 | 15.8 | 15.7 |
| වතු | 1.0 | 1.1 | 0.9 |
| ශ්‍රී ලංකාව | 18.4 | 19.7 | 20.2 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2006-2013

එලෙස ම ශ්‍රී ලංකාවේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු අනුව පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අනෙකුත් අංශයන්ට සාපේක්ෂව වතු අංශය තුළ ඉහළ අගයක් ගන්නා බවයි. එහි දී 2002 වර්ෂය වනවිට නාගරික මට්ටමින් දරිද්‍රතාවය 7.9% ක් ද, ග්‍රාමීය මට්ටමින් දරිද්‍රතාවය 24.7% ක් ද වනවිට වතු මට්ටමින් දරිද්‍රතාව 30.0% ක් විය. එලෙස ම 2012 වර්ෂය වනවිට දරිද්‍රතාව ක්‍රමයෙන් අඩු වී තිබුණ ද අනෙකුත් අංශයන්ට සාපේක්ෂව වතු අංශයේ දරිද්‍රතාව ඉහළ අගයක් ගන්නා බව දැකගත හැකි ය. එය නාගරික අංශය තුළ 2.1% ක් ද, ග්‍රාමීය අංශය තුළ 7.6% ක් ද, වතු අංශය තුළ 10.9% ක් ද වේ. එම තත්ත්වය පහත පරිදි දැක්විය හැකි ය.

වගුව 02: අංශ අනුව දරිද්‍රතාව

| අංශය | 1990/91 | 1995/96 | 2002 | 2006/07 | 2009/10 | 2012/13 |
|---|---|---|---|---|---|---|
| නාගරික | 16.3 | 14.0 | 7.9 | 6.7 | 5.3 | 2.1 |
| ග්‍රාමීය | 29.4 | 30.9 | 24.7 | 15.7 | 9.4 | 7.6 |
| වතු | 20.5 | 38.4 | 30.0 | 32.0 | 11.4 | 10.9 |
| ශ්‍රී ලංකාව | 26.1 | 28.8 | 22.7 | 15.2 | 8.0 | 6.7 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, කුටුම්භ ආදායම් වියදම් සමීක්ෂණ වාර්තා 1990-2013.

මේ අනුව ඉහත වගුවෙන් නිරූපණය වන පරිදි නාගරික, ග්‍රාමීය හා වතු යන අංශ වෙන් වෙන් ව සැලකිල්ලට ගැනීමේ දී ඉහළ ම දරිද්‍රතාව පවතින්නේ වතු අංශයේ ය. වතු ජන සංඛ්‍යාවෙන් 11.4% ක් දිළින්දන් ය. සාපේක්ෂ වශයෙන් දරිද්‍රතාව අඩු ම ප්‍රතිශතයක් පවතින්නේ නාගරික අංශය තුළ ය. නාගරික අංශයට වඩා වැඩි එහෙත් වතු අංශයට වඩා අඩු දරිද්‍රතාවක් ග්‍රාමීය අංශය තුළ පවතී.

වතු අධ්‍යාපනය දෙස අවධානය යොමු කරන විට අධ්‍යාපනය කෙරේ පිවිසීමට අවස්ථා නොමැතිකම ප්‍රාදේශීය ශ්‍රම බලකායක්, නූගත් මෙන් ම අනෙකුත් අංශවලට සංක්‍රමණය වීමට නොහෙන පරිදි පවත්වා ගෙන යාමේ ප්‍රධාන යාන්ත්‍රණය වී ඇත. වතු කළමනාකරණය ඓතිහාසිකව ම වතු ශ්‍රමිකයන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට දක්වා ඇත්තේ අඩු ප්‍රමුඛතාවයකි. වතු පාසල් හිතාමතා ම සැලසුම් කොට ඇත්තේ දරුවන් ඔවුන්ගේ පවුල් වාසය කරන වතුවල ශ්‍රමිකයන් ලෙස ලියාපදිංචි කරන අවස්ථාව වන පස් වන පංතිය දක්වා අධ්‍යාපනය සැපයීමට පමණි (බියන්විල, 2013). මේ අනුව වතු අංශයේ අධ්‍යාපන මට්ටම පිළිබඳව අවධානය යොමුකරන විට දී අනෙකුත් අංශයන්ට සාපේක්ෂව වතු අංශය තුළ අඩු අධ්‍යාපන මට්ටමක් පවතින බව හඳුනාගත හැකි ය. එහි දී වතු අංශය තුළ පාසල් නොයන ප්‍රතිශතය 2012/13 කාලය තුළ දී 13.2% ක් ද, ග්‍රාමීය අංශය තුළ 3.5% ක් ද, නාගරික අංශය තුළ 1.9% ක් ද වේ. අ.පො.ස. (උ/පෙ) සහ ඉහළ විභාග සමත් පිරිස වතු අංශය තුළ 1.7% ක් ද, ග්‍රාමීය අංශය තුළ 9.2% ක් ද, නාගරික අංශය තුළ 23.2% ක් ද වේ. මේ අනුව වතුකරයේ ජනතාවගේ අධ්‍යාපන මට්ටම ඉතා පහත් මට්ටමක පවතින බව හඳුනාගත හැකි ය. මෙම වතුකරයේ ජනතාවගේ අධ්‍යාපනය පිළිබඳව "ඉගෙනීමට ගන්නා වෙර" නම් කෘතියේ කතෘ මෙලෙස සඳහන් කර ඇත. "අධ්‍යාපනය වතු සංස්කෘතියේ අංගයක් නොවී ය. එය තාක්ෂණික වශයෙන් අවශ්‍ය නො වූ එසේම තම පැවැත්ම පිළිබඳ වටිනාකමක් ද නො වූවක් විය. කම්කරුවන්ගේ දරුවන්ට එය ගැලවීමේ මාර්ගයක් වන්නේ ය. නමුත් වැවිලිකරුවාට එය ශ්‍රමය ලබා ගැනීමේ දී බලවත් තර්ජනයක් ද විය." යනුවෙනි (ලිට්ල්, 2002). මේ අනුව අනෙකුත් අංශයන්ට සාපේක්ෂව වතු අංශය කෙරෙහි අවධානය යොමු කරන විට දී මෙම ජන කොටසට ප්‍රමාණවත් තරම් අධ්‍යාපන පහසුකම් ලැබී නොමැතිවීම මේ කෙරෙහි ප්‍රධාන වශයෙන් ම බලපා ඇත.

එලෙස ම වර්තමානය වන විට ද මෙම වතුවල ලැයින් කාමර දක්නට ලැබෙන අතර එම අවම මූලික පහසුකම්වලින් යුත් නිවාසවල තවමත් වතු කම්කරුවන් පදිංචිව සිටී. එම ලැයින් කාමර ප්‍රමාණවත් ඉඩ, වාතාශ්‍රය සහ සනීපාරක්‍ෂාව නොමැති ඒවා වේ. මොවුන් තමන්ට අවශ්‍ය කරන මූලික අවශ්‍යතාවන් වන ආහාර, නිවාස, ඇඳුම් පැළඳුම්, සෞඛ්‍ය පහසුකම්, පානීය ජලය, සනීපාරක්ෂක පහසුකම්, මූලික අධ්‍යාපනය යනාදිය ප්‍රමාණවත්ව නොමැතිව ඉතාමත් දිළිඳු ජීවිතයක් ගතකරනු ලබයි.

**සමාලෝචනය**

මේ ආකාරයට සමස්ථයක් ලෙස ගත් කල  වතු අංශය තුළ ජනතාවගේ ජීවන තත්ත්වය අනෙකුත් අංශයන් වන ග්‍රාමීය සහ නාගරික අංශයන්ට සාපේක්ෂව අඩු දියුණු මට්ටමක පවතී. ප්‍රමාණවත් නොවන අධ්‍යාපන පහසුකම් භුක්ති විඳීම, අවම වේතනයකට තම ශ්‍රමය සැපයීම, රැකියා සොයා යාමේ දී හැකියා හා දක්ෂතා අඩුකම, භාෂා දුෂ්කරතා, බාහිර සමාජය සමඟ සබඳතා නොමැතිකම, සමාජ වරප්‍රසාද අවම මට්ටමින් භුක්ති විඳීමත්, අවශ්‍ය යටිතල පහසුකම්වලට ප්‍රවේශවීමට ඇති නොහැකියාවත් යනා දී ගැටලු නිසා දිළිඳුකම මොවුන්ගේ සමාජ ගැටලුවක් බවට පත් වී ඇත.

ශ්‍රී ලංකාවේ වැවිලි ආර්ථිකය නඟා සිටුවීමට උපරිම ශ්‍රම දායකත්වයක් සපයන පිරිසක් ලෙස මෙම වතු කම්කරුවන් හැඳින්විය හැකි ය. ඔවුන්ගේ පැමිණීමත් සමඟ ම මෙරට තුළ ඔවුන් වෙනුවෙන් විවිධ රජයන් විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ ද තවදුරටත් ඔවුන් ඉතාමත් අඩු දියුණු මට්ටමකින් ජීවත් වෙනු දැකගත හැකි ය. මේ නිසා සමස්ත සමාජයේ අවධානය මොවුන් වෙත යොමුවිය යුතු ය. විශේෂයෙන් ම මොවුන්ට ජීවත්වීමට සුදුසු සමාජ වටපිටාවක් නිර්මාණය කළයුතු කාලය එළඹ ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ඊරියගම, ටී. (1997), *"ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය"*, ජාතික අධ්‍යාපන පදනම, කොළඹ.

කර්තෘ අප්‍රකාශිත, (1980), *"වතු කම්කරුවෝ "*, ආර්ථික විමසුම, මාර්තු 5 වෙළුම. පර්යේෂණ දෙපාර්තමේන්තුව, මහජන බැංකුව.

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, (2009/10), ශ්‍රී ලංකාවේ දරිද්‍රතා විමසුම, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

බියන්විල, ජේ. (2013), *"ගෝලීය දකුණේ කම්කරු ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ වෘත්තීය සමිති"*, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, 12, සුලෙයිමන් ටෙරස්, කොළඹ 05.

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, *''දස අවුරුදු දැක්ම සංවර්ධන ප්‍රතිපත්ති රාමුව 2006-2016''*, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව,

ලිට්ල්, ඒ.ඩබ්ලිව්. (2002), *"ඉගෙනීමට ගන්නා වෙර"*, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය, 425/15, තිඹිරිගස්යාය පාර, කොළඹ 05.

හෙට්ටිආරච්චි, යූ. (2007), *"1977 න් පසු ශ්‍රී ලංකාවේ ආර්ථිකය"*, සරසවි මුද්‍රණාලය, දළුගම, කැළණිය.

Household Income and Expenditure Survey (2009/10), Department of Census and Statistics, https://www.ilo.org/public/english/bureau/stat/download/17thicls/ r2hies .pdf, viewed on 20 August 2015.

Household Income and Expenditure Survey (2012/13), Department of Census and Statistics, https://www.ilo.org/public/english/bureau/stat/download/17thicls/ r2hies .pdf, viewed on 20 August 2015.